ලේඛ අංක 11/2015

RG/MBD/1/2012


දුරකථන අංක / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / Fax No. 2889491

ඊ මේල් / E-mail: info@rgd.gov.lk, rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / P. O. Box No 566

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.


# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය

HEAD OFFICE


වෙබ් අඩවිය / Web site: www.rgdept.lk


දිනය / Date: 2015.12.21

සියළුම උප්පැන්න, මරණ සහ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්,

**<u>රෝහල් තුලදී සිදු වන මළ දරු උපතක් සම්බන්ධ විස්තර සැපයීම (B -22)</u>**

දිවයිනේ සියළුම රජයේ සහ පෞද්ගලික රෝහල් තුළ සිදුවන මළ දරු උපත් අනිවාර්යයෙන්ම ලියාපදිංචි කිරීමට තීරණය කර ඇත. එබැවින් රෝහල් තුළ සිදුවන මළ දරු උපත් පිළිබඳව රෙජිස්ට්‍රාර්වරුන්ට වාර්තා කළ යුතු බවට චක්‍රලේඛයක් මේ වන විට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සියළුම රජයේ හා පෞද්ගලික රෝහල් වෙත නිකුත් කර ඇත. එම උපදෙස් අනුව මළ දරු උපතක් පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට "මළ දරු උපත් ප්‍රකාශය (B 22)" ආකෘතිය භාවිතා කරනු ලබයි.

02. එබැවින් රෝහලක සිදුවූ මළ දරු උපතක් සම්බන්ධයෙන් "මළ දරු උපත් ප්‍රකාශය (B 22)" මගින් ඔබ වෙත තොරතුරු ලැබුන විට, එම මළ දරු උපත නිසි පරිදි මළ දරු උපත් ලේඛනයේ (B 3 ආකෘතියේ) ලියාපදිංචි කරන්න. ලියාපදිංචි කරන ලද එම මළ දරු උපත් පිළිබඳ විස්තර B 128 ආකෘතියෙන්, ඔබ අයත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත මාසිකව වාර්තා කිරීමට කටයුතු කරන්න. අදාල මාසය තුළදී ලියාපදිංචි කිරීමක් සිදුවී නොමැති නම්, ඒ බව හෝ වාර්තා කළ යුතු බව කාරුණිකව දන්වමි.

03. මේ සම්බන්ධයෙන් උපදෙස් දැක්වෙන දෙපාර්තමේන්තු අත්පොතේ IV වන කාණ්ඩයේ V පරිච්ඡේදයේ 85(2) වන නියෝගය සහ V වන කාණ්ඩයේ V වන පරිච්ඡේදයේ 31 වන නියෝගය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

**ජ. එම්. ගුණසේකර**

**රෙජිස්ට්‍රාර් ජනරාල්**

CamScanner